දිනමිණ සිළුමිණ epaper

# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් මවිසින් භාර ගනු ලැබේ.

## මස් සැකසුම්කරු : (Slaughterman) පහළ ශ්‍රේණිය

**වැටුප් පරිමාණය : 27025 – 15 X 250 – 30775/- [U-PL 1(III)]**

**සුදුසුකම්**

1. 8 ශ්‍රේණිය සමත් විය යුතුයි.
2. වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.
3. සත්ත්ව ගොවිපලක ඇති කරන ඌරන් කුකුලන් බැටළුවන් එළුවන් සහ හාවුන් වැනි සතුන් මැරීම සහ එම සතුන්ගේ මස් සකස් කිරීම පිළිබඳ හැකියාවක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සටහන**

(අ) ඉහත සඳහන් වැටුපට අමතරව, රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ මූලික වැටුපෙන් 20%ක් වන අතිරේක දීමනාවක්ද මූලික වැටුපෙන් 45% ක් වන මාසික හිලව් දීමනාව සහ 5000/-ක් වන විශේෂ දීමනාවක්ද මාසිකව ගෙවනු ලැබේ.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට මෙන්ම විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයටද දායක වනු ඇත. ඒ අනුව සේවකයාගේ වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන අතර, එම වැටුපෙන් 7% කට හා 8% කට සමාන වන කොටස් සේව්‍යයා විසින් පිළිවෙළින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. මීට අමතරව සේව්‍යයා විසින් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදලට බැරකරනු ලැබේ.

(ඇ) අයදුම්කරුවන් තම නම, උපන් දිනය, වයස, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය,දුරකථන අංකය, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ආදී විස්තර හා තමන් පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකුගේ නම් ද ඇතුලත්ව අයදුම්පත් 2024-02-20 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් පෞද්ගලිකව භාර නොගන්නා අතර, පෞද්ගලිකව භාර දෙන අයදුම්පත් සම්බන්ධව වග කියනු නොලැබේ. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම තනතුර සඳහා පත්කිරීමට සුදුස්සන් තෝරා ගැනීම ඒ සඳහා පවත්වනු ලබන වෘත්තීය/ප්‍රායෝගික හා / හෝ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කෙරෙනු ඇත.

**වැඩබලන ලේඛකාධිකාරී,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය,**
**පේරාදෙණිය.**
**2024-01-19**